වලපනේ ප්‍රාදේශීය සභාව

වලපනේ ප්‍රාදේශීය සභාවේ රියදුරු තනතුර (ප්‍රාථමික ශිල්පීය) සඳහා සේවකයින් හතර දෙනෙකු (04) දෛනික වැටුප් මත මාස 06 ක කාලයකට සේවයේ යෙදවීම සඳහා අයදුම්පත් කැඳවීම

වලපනේ ප්‍රාදේශීය සභාවේ පහත උපලේඛනයේ සඳහන් තනතුරට අදාළව සේවයේ යෙදවීමට වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර	*පුරප්පාඩු සංඛ්‍යාව*
රියදුරු (දෛනික වැටුප් පදනම මත)	04

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල රියදුරු (ප්‍රාථමික ශිල්පීය) සේවා ව්‍යවස්ථාව, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික මට්ටමේ ශිල්පීය සේවක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව සුදුසුකම් :

01.1 ශ්‍රේණිය : III ශ්‍රේණිය (දෛනික පදනම මත)\

01.2 සුදුසුකම් :

01.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අනු. අංකය	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*අනුයුක්ත කරන ස්ථානය සහ කාර්යය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
01	රියදුරු (දෛනික)	04	අනුයුක්ත කරන ස්ථානය : වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, පවතින සේවා අවශ්‍යතාවය පිළිබඳව සළකා බලා අනුයුක්ත කරනු ලැබේ කාර්යය : මූලික අවශ්‍යතාවයක් වන ප්‍රවාහනය සම්බන්ධ කාර්යයන්ගෙන් සමන්විත වූ කාර්යය භාරයක් සහ ලේකම් විසින් සේවයේ අවශ්‍යතාවය මත පවරනු ලබන රාජකාරි කටයුතු ද මෙම තනතුරු දරන්නන්ට පැවරේ.	අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සමග යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරක දී සමත් වී තිබිය යුතුයි.

01.2.2 වෘත්තීය සුදුසුකම් :

01.2.2.1 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ ලොරි රියදුරු, ට්‍රැක්ටර් රථ රියදුරු තනතුර සඳහා අදාළ වන කාණ්ඩයේ වාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම

තනතුරු නාමය	*සම්පූර්ණ කළ යුතු සුදුසුකම්*
රියදුරු	තාරබර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.

01.2.2.2 ඊට අමතරව ඉහත බලපත්‍රයට අතිරේකව යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධ රජයේ පිළිගත් ආයතනයකින් (NAITA/ ICTAD) ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටම (NVQ-4) පුහුණු සහතිකය ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සළකනු ලබන අතර බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

01.2.3 **පළපුරුද්ද :** බර වාහන පැදවීමේ බලත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

01.2.4 **කායික සුදුසුකම් :**

(i) සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රීකාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ii) අවම උස අඩි 05 අඟල් 02 ½ ක් විය යුතුය.

01.2.5 **වෙනත්:**

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුයි.

III. අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

01.3 **වැටුප :** රා. ප. ච. 10/2025 හි PL 3-2025 අනුව 2026.01.01 දින සිට ගෙවිය යුතු මාසික වැටුපෙන්

(වැඩ කරන දිනකට වැටුප :	වැටුප	රු. 41,209/30	=	රු. 1,373.63
	දීමනා	රු. 17,800/30	=	රු. 593.33
				1,966.96

01.4 **වයස:**

01.3.1 අවම වයස් සීමාව : අවුරුදු 21 යි

01.3.2 උපරිම වයස් සීමාව : අවුරුදු 40 යි

01.5 **බඳවා ගැනීමේ ක්‍රමය:**

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

01.5.1 **ලිඛිත විභාගය :** පහත සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

පළාත් පාලන රියදුරු (දෛනික) - බඳවා ගැනීමේ තරග විභාගය :

1. විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*මුළු ලකුණු*	*මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම	පැය 01	100	40%
2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	පැය 01	100	20%

2. මෙම පරීක්ෂණය වලපනේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් පවත්වනු ලැබේ.

3. තරග විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රජය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.

4. සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුනු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතු වේ.

5. **විභාගය සඳහා විෂය නිර්දේශය :**

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි
2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

01.5.2 **වෘත්තීය පරීක්ෂණය :**

	පරීක්ෂා කර ලබා දෙනු ලබන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
1	රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය	40	ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රා යෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.
2	මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම	40	
3	මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	20	
	මුළු ලකුණු ප්‍රමාණය	100	

01.6 **අයදුම් කළ යුතු ආකාරය:**

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12' x 8' ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර "වලපනේ ප්‍රාදේශීය සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත බඳවා ගැනීම " ලෙස අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2026.04.10 දිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, වලපනේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග පහත ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත්
3. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්
4. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරි සහතිකය
5. පොලිස් වාර්තාව

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම වලපනේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

මෙම නිවේදනය සිංහල, දෙමළ අනුවාදනයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනය අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

ලේකම්,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2026 මාර්තු මස 16 දින,
වලපනේ ප්‍රාදේශීය සභාවේ දී ය.